# පටුන

➢ කෙටි යෙදුම්

**පරිච්ඡේද**


**1. වන පරිච්ඡේදය- සංවිධානය**

1.1 දැක්ම 01

1.2 මෙහෙවර 01

1.3 සංවිධානයේ අරමුණු 01

1.4සංවිධානයේ කාර්යයන් 01-02

1.5 සංවිධාන ව්‍යුහය 02

1.6 අධ්‍යක්ෂ මණ්ඩලය 03

**2. වන පරිච්ඡේදය -නීතිමය රාමුව**

2.1 සංවිධානය පිහිටුවීමට අදාල නීතිමය පසුබිම 04

**3. වන පරිච්ඡේදය -සභාපතිවරයාගේ විවරණය 05**

**4. වන පරිච්ඡේදය -කාර්යසාධනය**

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2022 6-7

4.2 කාර්ය සාධනය 7-8

4.3 කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය 9-10

**5. වන පරිච්ඡේදය- වර්ෂය සඳහා සමස්ත මූල්‍ය ප්‍රකාශ**

5.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ අයවැය 11

5.2 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ මූල්‍ය වාර්තා 12-17

5.3 විගණකාධිපති වාර්තාව 18-23

5.4 විගණකාධිපති වාර්තාව මත කරුණු පැහැදිලි කිරිම 24-25

**6. වන පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ 26**

**7.වන පරිච්ඡේදය- කාර්යභාරය ඉටුකිරිමේදී මුහුණුදුන් අභියෝග හා ගැටළු** 27

# කෙටි යෙදුම්

- WBB – සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
- WBB Act – ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනත
- WB – ලෝක බැංකුව
- WBIU – සුබසාධක ප්‍රතිලාභ තොරතුරු ඒකකය
- WBS – සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
- BCP – ව්‍යාපාර අඛණ්ඩ සැලසුම
- DRMS – ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය
- DSD – ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ
- HR - මානව සම්පත
- MSD – කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
- ITC – තොරතුරු තාක්ෂණ සන්නිවේදනය
- ICTA – තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
- IIL – ඉන්ෆොමැටික්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ්
- IT - තොරතුරු තාක්ෂණය
- IWMS – ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතිය
- IEC – තොරතුරු අධ්‍යාපනික සහ සන්නිවේදනය
- SSNP – සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය
- SRIS – සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය
- SRU – සමාජ ආරක්ෂණ තොරතුරු ඒකකය
- SQL – ව්‍යුහගත විමසුම් භාෂාව
- PMU – මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- TOR – යොමු කිරීමේ නියමයන්

# 1 වන පරිච්ඡේදය - සංවිධානය

## 1.1 දැක්ම

**අවැසි තැන අස්වැසුම සදමින් ශ්‍රී ලාංකීය දිළිඳු ජන ජීවිත ප්‍රසස්ථ මට්ටමකට ඔසවා තැබීමේ ගමනෙහි පෙරගමන්කරු බවට පත්වීම.**

## 1.2 මෙහෙවර

පනතේ අරමුණු සාක්ෂාත් කිරීමට අදාළව සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා සුබසාධන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පැනනඟින අවශ්‍යතා හඳුනාගැනීම සහ සංවර්ධනය කිරීම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මෙහෙවර විය. මේ අනුව, මෙහෙවර ප්‍රකාශය පහත පරිදි වේ.

"ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී විනිවිදභාවය සහ සමානාත්මතාවය සහතික කරමින් සියලුම ඉලක්කගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා සංගත සුබසාධන කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම".

## 1.3 සංවිධානයේ අරමුණු

- සියලු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා නිතිමය රාමුවක් සැකසීම
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා විනිවිදභාවයකින් යුක්ත ක්‍රමවේදයක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැකසීම

## 1.4 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන්


ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම;

- පනත මඟින් පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.
- මණ්ඩලයට පවරනු ලැබ ඇති ඕනෑම බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් දිස්ත්‍රික් ලේකම්,

ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි හෝ රජයේ නිලධාරියෙකු වෙත පැවරීම.

- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.
- සුදුසුකම් ලැබීම සඳහා වන නිර්ණායක සකස් කිරීම.
- යෝජනා ක්‍රමයක් අනුව මූල්‍ය ප්‍රතිපාදන නිශ්චය කිරීම.
- සුබසාධක ප්‍රතිලාභ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරිම
- ඉලෙක්ට්‍රොනිකව සමාජ ආරක්ෂණ දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගෙනයාම.
- යෝජනා ක්‍රමය ආරම්භ කරන  දිනය නිශ්චය කිරීම.
- ප්‍රදානය කළ යුතු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ නිශ්චය කිරීම.
- පුද්ගලයන්ට ප්‍රතිලාභ ලැබිය යුතු කාල සීමාව සඳහන් කිරීම.

## 1.5 සංවිධානයේ ව්‍යුහය



## 1.6 අධ්‍යක්ෂ මණ්ඩලය

2022.01.01 දින සිට 2022.07.06 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයකින් තොරව වැඩබලන අතිරේක කොමසාරිස්වරයකු යටතේ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පාලනය විය.

- වැඩබලන අතිරේක කොමසාරිස් - එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මහතා

2022.07.07 වන දින බී. විජයරත්න මහතා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

- බී. විජයරත්න මහතා – සභාපති/ කොමසාරිස්
- කමල් පත්මසිරි මහතා – සාමාජික
- ඒ.ආර්. දේශප්‍රිය මහතා – සාමාජික
- කුමාර දුනුසිංහ මහතා – සාමාජික
- කේ.එච්. ජෙසී මලර් මිය – සාමාජික

මෙම කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පහක් පැවැත්විණි.

# 2 වන පරිච්ඡේදය - නීතිමය රාමුව

## 2.1 සංවිධානය පිහිටුවීමට අදාල නීතිමය පසුබිම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව 2016 ජූලි මස පිහිටුවන ලද අතර එය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 පෙබරවාරි 02 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 1952/22 යටතේ 2016 පෙබරවාරි 15 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව සඳහන්ව ඇත. සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තියට අනුව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ද විමසා වසර තුනක කාලයක් සඳහා මණ්ඩලයට සභාපති සහ සාමාජිකයින් සිව් දෙනෙකු පත් කරනු ලැබිය යුතුය. ඒ අනුව මුල්ම අධ්‍යක්ෂ මණ්ඩලය 2016 ජූලි මාසයේදී පත්කර තිබුණි.

## 3 වන පරිච්ඡේදය - සභාපතිවරයාගේ විවරණය

### සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිතුමාගේ සමාලෝචනය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2002 අංක 24 දරණ සුබසාධක ප්‍රතිලාභ පනතේ වන වගන්ති ප්‍රකාරව පිහිටුවා අංක 1952/22 හා 2016 පෙබරවාරි 02 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය යටතේ 2016 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක විය.

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය සහ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය ඒකාබද්ධව පනතේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන අතර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම සඳහා ලෝක බැංකුව විසින් සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය හරහා අරමුදල් සපයයි.

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන් ඉටුකර ගැනිම සඳහා දිස්ත්‍රික් ලේකම්,ප්‍රාදේශිය ලේකම්,ග්‍රාම නිලධාරීන් ඇතුලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ක්ෂේත්‍ර රාජකාරී ඉටුකරන අනෙකුත් නිලධාරීන් සහාය ලබා ගන්නා අතර මේ යටතේ මූලිකවම අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වේ.

මෙම වසරේ එනම්, 2022 සැප්තැම්බර් 01 වන දින සිට අස්වැසුම වැඩසටහන යටතේ අයදුම්පත් කැඳවීම ආරම්භ කළ අතර පියවර 05ක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

ඉලක්කගත ප්‍රජාව නිවැරදිව හඳුනාගත් සමාජ සුබසාධක දත්ත පද්ධතියක අවශ්‍යතාවය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි මෙරටට ආධාර සපයන පාර්ශවකරුවන් තහවුරු කර ඇති අතර ඒ අනුව, අංක 2308/08 දරණ 2022/11/29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව 2022 අංක 02 දරණ ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතිය (IWMS) ස්ථාපිත කර ඒ හරහා අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වේ.

මෙම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරිම මෙම වර්ෂය තුළදී ආරම්භ කිරිමට හැකිවිය. විවිධ පාර්ශව වලින් ඉදිරිපත්වූ විරෝධතා හා අභියෝග මධ්‍යයේ මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සියල්ල සම්පූර්ණව නොතිබූ බැවින් ඒවා සපුරාගැනිම සඳහාද විශාල වෙහෙසක් දැරීමට සිදුවිය. ඒ අනුව IWMS නමින් පරිඝනක පද්ධතියක සංවර්ධනය කිරිමේ කටයුතුද කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබාගැනීමේ හා බඳවා ගැනීමේ කටයුතුද කාර්යාල උපකරණ හා අනෙකුත් භෞතික සම්පත් සපයාගැනිමේ කටයුතුද වැඩසටහන ක්‍රියාත්මක කරන අතරතුරුම ඉටු කරගැනිම සඳහා ප්‍රයත්න දැරීමට සිදුව තිබුනි.

මෙම කාර්යයන් සාර්ථක කර ගැනීමට මුදල් අමාත්‍යතුමා,භාණ්ඩාගාර ලේකම්,නියෝජ්‍ය ලේකම්, සහයෝගය ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ හා අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් ,සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ හා සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල නිලධාරීන් හා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සියලුම නිලධාරින් සැම විටකදීම නොමසුරුව සහයෝගය ලබා දුන්හ.



බී.විජයරත්න
සභාපති,සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
2022.12.20

## 4 වන පරිච්ඡේදය -කාර්ය සාධනය

## 1.4වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| අංක | වගකීම් ක්ෂේත්‍රය | යෝජිත ක්‍රියාකාරකම | ක්‍රියාකරකමෙහි ප්‍රතිඵලය | ක්‍රියාකාරකමෙහි ඵලය |
|---|---|---|---|---|
| 1 | සුභසාධක කළමණාකරන පද්ධතියක්සමාජ ආරක්ෂණ ) ලේඛනයක් ඇති සංවර්ධනය /කිරිම (ක්‍රියාත්මක කිරිම/කිරිම<br><br>තොරතුරු පද්ධතිය<br>(SRIS) | ව්‍යාපෘතිය අවසන් කිරිම හා සැපයුම්කරු සමහ වසරකට නඩත්තු ගිවිසුමකට එළඹීම. | සාමාන්‍ය මහජනතාවට පූර්ණ ක්‍රියාකාරි SRIS | |
| | | SRIS සඳහා සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය මඟින් රැස්කල නියමු දත්ත ඇතුලත් කිරිමදත්ත තහවුරු ) (කිරිමේ ජංගම යෙදුම මගින් | තෝරාගත් ප්‍රාලේ . කාර්යාල මගින් ලැබූ දත්ත සම්පූර්ණකිරිම. | |
| | | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් දත්ත තහවුරු කිරිම(DCS) | සංඛ්‍යානමය ක්‍රියාවන්හි අවසන් ප්‍රතිඵලය යෙදවීම | |
| 2 | SRIS ඒකාබද්ධ කිරිම සඳහා පුළුල් කිරිම සුබසාධක කළමනාකරණ පද්ධතිය (IWMS) | ඒකාබද්ධ සුභසාධක කළමනාකරණ පද්ධතිය සම්පූර්ණ කිරිම (IWMS) | තාක්ෂණික වශයෙන් වැදගත් පද්ධතියක් දියුණු කිරිම | |
| | | IWMS මෙහෙයුම් ක්‍රමයක් ස්ථාපිත කිරිම | | |
| 3 | තිරසාරභාවය සහතික කිරිම | ධාරිතා සංවර්ධනය (පිරිස් කළමනාකරණ සංවර්ධන වැඩසටහන් WBB DSD මට්ටම) | | තාක්ෂණික හා මෙහෙයුම් දැනුමින් පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරිම |
| | | SRIS අඛණ්ඩව වැඩි දියුණු කිරිම | | කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දැනුම වර්ධනය කිරිම |
| | | ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරිම | | ප්‍රතිපත්තියකින් යුත් කාර්යාල පරිසරයක් පවත්වාගෙන යාම |
| 4 | ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරිම හා යතාවත් කිරිම | එදිනෙදා මෙහෙයුම් කටයුතු සඳහා දායක වන සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කිරිම WBB හා ප්‍රා ලේ මට්ටම දක්වා වූ. IWMS | | සංවිධානයේ සියළුම කාර්යයන් පවත්වාගෙන යාමට අවශ්‍ය ශක්තිමත් ආයතනික ව්‍යුහයක් ඇති කිරිම |
| | | සංවිධානය සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම | | වියිමත් විශේෂතාවයෙන් යුත් සංවිධාන ව්‍යුහයක් ස්ථාපිත කිරිම |

| | | | | |
|---|---|---|---|---|
| 5 | IWMS සඳහා එලදායි සන්නිවේදන ක්‍රමයක් | විධිමත් සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරිම | | බිම් මට්ටම දක්වා ශක්තිමත් සන්නිවේදන ක්‍රමයක් ඇති කිරිම |
| | | අඛණ්ඩ මෙහෙයුම් හා වැඩිදියුණු කිරිමේ ක්‍රමයක් | | මෙහෙයුම් පද්ධතිය සමඟ නොබිඳුණු සම්බන්ධතාවක් |
| 6 | සම්බන්ධිත ආයතන සමඟ නීතිමය රාමුව ශක්තිමත් කිරිම (සමෘද්ධි දෙපාර්තමේන්තුවවැඩිහිටි , ආබාධිත ,ලේකම් කාර්යාලය මහලේකම් කාර්යාලය) | ආයතන අතර අවබෝධතා ගිවිසුම් සකස්කර අත්සන් කිරිම | | ආයතන අතර විධිමත් නෛතික රාමුවක් ගොඩ නැගීම |
| 7 | IWMS සඳහා යටිතල පහසුකම් ශක්තිමත් කිරිම | TAB පරිඝනක සඳහා ප්‍රසම්පාදනය අවසන් කිරිම | | දත්ත ලබාගැනීමේ කාර්යක්ෂමතාවය වැඩි කිරිම |
| | | ප්‍රා 332කට කාර්යාල .ලේ. TAB පරිඝනක බෙදා හැරිම | | ප්‍රාලේ කාර්යාල . වල බිම් මට්ටමේ පුහුණු කාර්ය මණ්ඩලයක් |
| | | බෙදාහරින ලද TAB පරිඝනක අඛණ්ඩව මෙහෙයවීම හා බෙදාහැරීම | | පද්ධති මෙහෙයුම් සමඟ නොබිඳුණු සම්බන්ධතාවයක් |

## 4.2කාර්ය සාධනය

### 4.2ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධනය

| Strategy | Program | Activities / Sub activities | Performance (%) | Remark |
|---|---|---|---|---|
| **SRIS** පිළිබඳ විශ්වාසනීයත්වය ශක්තිමත් කිරිම | SRIS නඩත්තු ගිවිසුම | • නඩත්තු ගිවිසුමWBB සහ IIL අතර<br>  ▪ බෙදාහැරීම් 07<br>• IIL විසින් එවන ලද මූල්‍ය යෝජනාව<br>• අමාත්‍ය ප්‍රසම්පාදන කමිටුවෙන් මූල්‍ය යෝජනාව අනුමතයි.<br>• නඩත්තු ගිවිසුම් ලිපිය IIL වෙත භාර දීම<br>• SRIS සංශෝධන ඉල්ලීම් තීරණය<br>  ▪ සංශෝධන ඉල්ලීම් සඳහා | 60 % | පළමුවැනි බෙදාහැරීම සම්පූර්ණයි |

| | | | | |
|---|---|---|---|---|
| | | තීරණ ලබාදීමේ රැස්වීම් | | |
| | SRIS භාරදීමේ ක්‍රියාවලිය | • රැස්වීම් සහ වැඩමුළු පැවැත්වීම<br>• SRIS නඩත්තු ගිවිසුම ගැන දැනුම හුවමාරුව | 75 % | WBB වෙත භාරදීම අවසන් කර නැත |
| | SRIS අවසන් කිරිම | • පළමු බෙදා හැරීම නිමකිරිම හා ගෙවීම<br>• අවසන් නොවූ බෙදාහැරීමේ ලිපි ගැටළුව | 100 % | WBB වෙත SRIS බෙදා හැරිම අවසන් කර නැත |
| | අවකාශ සර්වර් පහසුකම් | • IWMS පද්ධතිය සඳහා අවකාශ පහසුකම් ක්‍රියාත්මක කිරිම<br>• ICTA සර්වර් උපකරණ ශක්තිමත් කිරිම | 100 % | මයික්‍රොසොෆ්ට් ඇෂුවර් අවකාශ සර්වර් වෙත මාරුවීමට තීරණය විය |
| **IWMS** පිළිබඳ විශ්වාසනීයත්වය ශක්තිමත් කිරිම | ජංගම යෙදුම සහ LISH පද්ධතිය සංවර්ධනය කිරිම | ▪ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ අභ්‍යන්තර යෙදුම සංවර්ධනය කිරිම<br>▪ ජංගම යෙදුම සහ LISH පද්ධතිය සංවර්ධනය කිරිමේ තීරණය සඳහා රැස්වීම | 100 % | සම්පූර්ණයි |
| සඵලදායි සන්නිවේදනය | මහජනතාව සඳහා විධිමත් සන්නිවේදන ක්‍රමයක් | • 1924 ක්‍රියාත්මක කිරිම (සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය) call center on this process<br>• මෙම ක්‍රියාවලිය සඳහා ඇමතුම් මධ්‍යස්ථානයේ අවශ්‍යතා සම්පූර්ණ කිරිම | 75 % | ක්‍රියාත්මක වෙමින් පවතී |

| | | | | |
|---|---|---|---|---|
| | WBB වෙබ් අඩවිය පිහිටුවීම | • නවWBB වෙබ් අඩවියක් ක්‍රියාත්මක කිරිම<br>• වෙබ් අඩවි කෝඩින් ස්ථාපිත කිරිම | 50 % | ක්‍රියාත්මක වෙමින් පවති |
| | කෙටි පණිවිඩ යැවීමේ ක්‍රියාවලිය (නිලධාරීන් හා ප්‍රතිලාභීන් සඳහා) | • කෙටි පණිවිඩ සපයන්නන් තෝරා ගැනීමේ ප්‍රසම්පාදනය | 50 % | ක්‍රියාත්මක වෙමින් පවති. |
| | වට්ස්ඇප් සන්නිවේදනය | • ප්‍රා.ලේ කොට්ඨාශ මට්ටමේ නිලධාරි සන්නිවේදනය | 100 % | දෛනික කටයුතු සිදුවේ |

## 4.3 කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

මෙම වගුව මඟින් 2022 වර්ෂය තුළ සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.

| අංක | වගකීම් ක්ෂේත්‍රය | යෝජිත ක්‍රියාකාරකම | ක්‍රියාකරකමෙහි ප්‍රතිඵලය | ක්‍රියාකාරකමෙහි ඵලය |
|---|---|---|---|---|
| 1 | සුභසාධක කළමණාකරන පද්ධතියක්සමාජ ආරක්ෂණ ) ලේඛනයක් ඇති සංවර්ධනය /කිරිම (ක්‍රියාත්මක කිරිම/කිරිම<br><br>තොරතුරු පද්ධතිය (SRIS) | ව්‍යාපෘතිය අවසන් කිරිම හා සැපයුම්කරු සමඟ වසරකට නඩත්තු ගිවිසුමකට එළඹීම. | සාමාන්‍ය මහජනතාවට පූර්ණ ක්‍රියාකාරි SRIS | |
| | | SRIS සඳහා සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය මඟින් රැස්කල නියමු දත්ත ඇතුලත් කිරිමදත්ත තහවුරු ) (කිරිමේ ජංගම යෙදුම මගින් | තෝරාගත් ප්‍රාලේ . කාර්යාල මගින් ලැබූ .දත්ත සම්පූර්ණ කිරිම | |
| | | ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් දත්ත තහවුරු කිරිම(DCS) | සංඛ්‍යානමය ක්‍රියාවන්හි අවසන් ප්‍රතිඵලය යෙදවීම | |
| 2 | SRIS ඒකාබද්ධ කිරිම සඳහා පුළුල් කිරිම සුබසාධක කළමනාකරණ පද්ධතිය (IWMS) | ඒකාබද්ධ සුභසාධක කළමනාකරණ පද්ධතිය සම්පූර්ණ කිරිම (IWMS) | තාක්ෂණික වශයෙන් වැදගත් පද්ධතියක් දියුණු කිරිම | |
| | | IWMS මෙහෙයුම් ක්‍රමයක් ස්ථාපිත කිරිම | | |
| 3 | තිරසාරභාවය සහතික කිරිම | ධාරිතා සංවර්ධනය (පිරිස් කළමනාකරණ සංවර්ධන වැඩසටහන් WBB DSD මට්ටම) | | තාක්ෂණික හා මෙහෙයුම් දැනුමින් පරිපූර්ණ කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරිම |
| | | SRIS අඛණ්ඩව වැඩි දියුණු කිරිම | | කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දැනුම වර්ධනය කිරිම |
| | | ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ස්ථාපිත කිරිම | | ප්‍රතිපත්තියකින් යුත් කාර්යාල පරිසරයක් පවත්වාගෙන යාම |
| 4 | ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරිම හා යතාවත් කිරිම | එදිනෙදා මෙහෙයුම් කටයුතු සඳහා දායක වන සංවිධාන ව්‍යුහයක් නිර්මාණය කිරිම WBB හා ප්‍රා ලේ මට්ටම දක්වා වූ. IWMS | | සංවිධානයේ සියළුම කාර්යයන් පවත්වාගෙන යාමට අවශ්‍ය ශක්තිමත් ආයතනික ව්‍යුහයක් ඇති කිරිම |
| | | සංවිධානය සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම | | විධිමත් විශේෂතාවයෙන් යුත් සංවිධාන ව්‍යුහයක් ස්ථාපිත කිරිම |
| 5 | IWMS සඳහා ඵලදායි සන්නිවේදන ක්‍රමයක් | විධිමත් සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරිම | | බිම් මට්ටම දක්වා ශක්තිමත් සන්නිවේදන ක්‍රමයක් ඇති කිරිම |
| | | අඛණ්ඩ මෙහෙයුම් හා වැඩිදියුණු කිරිමේ ක්‍රමයක් | | මෙහෙයුම් පද්ධතිය සමඟ නොබිඳුණු සම්බන්ධතාවක් |
| 6 | සම්බන්ධිත ආයතන සමඟ නීතිමය රාමුව ශක්තිමත් කිරිම (සමෘද්ධි දෙපාර්තමේන්තුවවැඩිහිටි , ආබාධිත ,ලේකම් කාර්යාලය මහලේකම් කාර්යාලය) | ආයතන අතර අවබෝධතා ගිවිසුම් සකස්කර අත්සන් කිරිම | | ආයතන අතර විධිමත් නෛතික රාමුවක් ගොඩ නැගීම |
| 7 | IWMS සඳහා යටිතල පහසුකම් ශක්තිමත් කිරිම | TAB පරිඝනක සඳහා ප්‍රසම්පාදනය අවසන් කිරිම | | දත්ත ලබාගැනීමේ කාර්යක්ෂමතාවය වැඩි කිරිම |
| | | ප්‍රා 332කට කාර්යාල .ලේ. TAB පරිඝනක බෙදා හැරීම | | ප්‍රාලේ කාර්යාල . වල බිම් මට්ටමේ පුහුණු කාර්ය මණ්ඩලයක් |
| | | බෙදාහරින ලද TAB පරිඝනක අඛණ්ඩව මෙහෙයවීම හා බෙදාහැරීම | | පද්ධති මෙහෙයුම් සමඟ නොබිඳුණු සම්බන්ධතාවයක් |

# 5 වන පරිච්ඡේදය-වර්ෂය සඳහා සමස්ත මූල්‍ය ප්‍රකාශ

## 5.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශ(අයවැය)

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සන්සන්දනාත්මක ආදායම් ප්‍රකාශය**

| | | | |
|---|---|---|---|
| **සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය** | | | |
| **මුදල්,ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය** | | | |
| | | | |
| **2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සන්සන්දනාත්මක ආදායම් ප්‍රකාශය** | | | |
| | | | |
| | | | |
| **විස්තරය** | **සටහන** | **2022** | **2021** |
| | | | |
| **ආදායම** | | | |
| | | | |
| රජයේ ප්‍රදාන | **1** | 7,188,000 | 4,845,000 |
| | | | |
| **වියදම්** | | | |
| පුද්ගල වැටුප් | **2** | 5,672,268 | 4,540,277 |
| වෙනත් මෙහෙයුම් වියදම් | **3** | 1,258,933 | 570,244 |
| | | 6,931,201 | 5,110,521 |
| | | | |
| **වර්ෂය සඳහා අතිරික්ත ය/(හිඟ ය)** | | **256,799.44** | **(265,521.02)** |
| | | | |

**5.2** මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ මූල්‍ය වාර්තා

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**

**මුදල්,ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | | 2022 | 2021 |
|---|---|---|---|
| | සටහන | රු. | රු. |
| සංචරක **01** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 04 | 0.00 | 11477.75 |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 05 | 289390.74 | 56086.21 |
| | | 289390.74 | 67563.96 |
| මූල්‍යකරණය කළේ | | | |
| ශුද්ධ වත්කම්/ස්කන්ධය | | | |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 4584793.00 | 4584793.00 |
| සමුච්චිත අතිරික්තය/(හිඟය) | | -4304256.38 | -4522655.82 |
| මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය | | 280536.62 | 62137.18 |
| ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | 06 | 8854.12 | 5426.78 |
| | | 289390.74 | 67563.96 |

Financial Statements presented in pages from 1 -3 and other notes to the accounts presented in pages from 4 - 10 are form integral parts of the Financial statements.
We hereby certify that figures in these Financial StatementsNotes to accounts have been prepared in accordance with the documents and information maintained by the Board

Name & Signature of Secretary
Ministry of Finance Economic Stabilization and National Policies .
28/12/23
K.M.M. Siriwardana
Secretary to the Treasury and
Secretary to the Ministry of Finance,
Economic Stabilization and National Policies
The Secretariat
Colombo 01.

Chairman
B. Wijayaratne
Chairman / CAO / Commissioner
Welfare Benefit Board
01" floor
New Building
Ministry Of Finance

Accountant (acting)
ACCOUNTANT
WELFARE BENEFIT BOARD

02

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය | | | |
| මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | | | |
| | | | |
| **2022** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය | | | |
| | | | |
| | දේපළ පිරියත හා උපකරණ සංචිතය | සමුච්චිත අතිරික්තය/(හිඟය) | එකතුව |
| | | | |
| **2021/01/01** දිනට ශේෂය | 4,584,793.00 | -4,257,134.80 | 327,658.20 |
| විගණන ගාස්තු-**2019** | | -38,400.00 | |
| වර්ෂය සඳහා අතිරික්තය /(හිඟය) | - | -265,521.02 | -265,521.02 |
| **2021/12/31** දිනට ශේෂය | 4,584,793.00 | -4,561,055.82 | 62,137.18 |
| | | | |
| | දේපළ පිරියත හා උපකරණ සංචිතය | සමුච්චිත අතිරික්තය/(හිඟය) | එකතුව |
| | | | |
| **2022/01/01** දිනට ශේෂය | 4,584,793.00 | -4,561,055.82 | 23,737.18 |
| වසර සඳහා දේපළ පිරියත හා උපකරණ සංචිතය | - | | - |
| වර්ෂය සඳහා අතිරික්තය /(හිඟය) | - | 256,799.44 | 256,799.44 |
| **2022/12/31** දිනට ශේෂය | 4,584,793.00 | -4,304,256.38 | 280,536.62 |

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | |
|---|---|
| **සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය** | |
| **මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය** | |
| | |
| **2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | |
| | **2022** |
| | රු. ශ. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | |
| | |
| වර්ෂය තුළ අතිරික්තය/හිඟය | 256,799.44 |
| වැඩිවන මෙහෙයුම් පිරිවැය | - |
| ගැලපීම: | |
| ක්ෂය වීම | 11,477.75 |
| | |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය | 268,277.19 |
| | |
| පෙර වසර ගැලපීම | -38,400.00 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ(වැඩිවීම/අඩුවීම) | 3,427.34 |
| ලැබිය යුතු දෑ (වැඩිවීම/ අඩුවීම) | - |
| | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල් | **233,304.53** |
| | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | - |
| ආයෝජන කටයුතු සඳහා යොදා ගන්නා ලද ශුද්ධ මුදල් | - |
| | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය | |
| කල්බදු ගෙවීම් | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් | - |
| | |
| වර්ෂය තුළ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම | 233,304.53 |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 56,086.21 |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ** | **289,390.74** |
| | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානකම් විශ්ලේෂණය කිරිම** | |
| | |
| | |
| | |
| **ඇමුණුම් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.** | |
| | |

**වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානකම් විශ්ලේෂණය කිරීම**

ඇමුණුම් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්**

**01. පොදු කරුණු**

1.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1952/22 අති විශේෂ ගැසට් නිවේදනය යටතේ 2016 පෙබරවාරි 15 වන දින යළිත් ක්‍රියාත්මක වන 2002 අංක 24 සුබසාධක ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය 2016 ජූලි මාසයේදී ස්ථාපිත කරන ලදී.

1.2 සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තියට අනුව ව්‍යවස්ථාදායක සභාව සමඟ සාකච්ඡා කර මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති විෂය භාර අමාත්‍යවරයා විසින් වසර තුනක කාලයක් සඳහා 2016 ජූලි මාසයේදී පත් කරන ලද සභාපති සහ සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ.

1.3 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මහලේකම් කාර්යාලය, කොළඹ 01 හි මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ 1 වන මහලේ පිහිටා ඇත.

1.4 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අරමුණු

- ප්‍රධාන අරමුණ, සියලු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා කාර්යය රාමුවක් සැලසීම.
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

සුබසාධක ප්‍රතිලාභ පනත මගින් ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම පිණිස සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට බලය ලබා දී ඇත.

- පනත මගින් ලබා දී ඇති හෝ පවරා ඇති බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම.
- මණ්ඩලයට පවරා ඇති බලතල දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි හෝ රජයේ නිලධාරියෙකුට පැවරීම.

- සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.
- සුදුසුකම් සඳහා වන නිර්ණායක සැකසීම.
- යෝජනා ක්‍රමයක් අනුව මූල්‍ය ප්‍රතිපාදන සඳහන් කිරීම.
- යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය නිශ්චය කිරීම.
- ප්‍රදානය කළ යුතු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ නිශ්චය කිරීම.
- ප්‍රතිලාභ ලැබීමට පුද්ගලයන්ට හිමිකම් ඇති කාල සීමාව සඳහන් කිරීම.

1.5. මූල්‍ය ප්‍රකාශනය

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශන මෙමඟින් ඉදිරිපත් කරයි.

## 02. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්වය පිළිබඳ විස්තීර්ණ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වියදම් ප්‍රකාශය, එහි ජංගම නොවන වත්කම් ලැයිස්තුව, මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් යන ලැයිස්තුන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.1 මූල්‍ය හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ.

2.2 අඛණ්ඩ පැවැත්ම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සැලසුම් කරන ලද පහත දක්වා ඇති ප්‍රතිපත්ති, සුබසාධක ප්‍රතිලාභ සඳහා සුදුසු ක්‍රමවේදයක් වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයන්ට අදාළ වේ.

2.3 පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇති අතර වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති වසර තුනක කාල සීමාවන්ට එය අඛණ්ඩව අදාළ කර ගැනීමට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය අපේක්ෂා කරයි.

- **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

සියලුම කාර්යාල උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තා කරනු ලබයි. උපකරණවල පිරිවැය යනු මිලදී ගැනීමේදී එකතු කළ අගය මත බද්ද සමඟ අත්පත් කර ගැනීමේ දී දරණ ලද පිරිවැයයි.

- **විස්තීර්ණ ආදායම් ප්‍රකාශ**

(අ) ආදායම් හඳුනා ගැනීම

ආදායමක් ලෙස සැලකෙන රජයෙන් ලැබෙන අග්‍රිම

(ආ) වියදම් හඳුනා ගැනීම

වියදම් ප්‍රකාශයේදී වියදම්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පරිපාලන හා සාමාන්‍ය වියදම්, සුබසාධක ප්‍රතිලාභ වියදම් හා සන්නිවේදන වියදම් ලෙස හඳුනාගනී. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා වන සියළුම වියදම්, වියදම් ප්‍රකාශයට ගෙන ඇත.

(ඇ) ක්ෂයවීම

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් පවරන ලද වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන වෙන්කර නොමැත. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වත්කම් පමණක් ක්ෂයවීම ගණනය කරන ලදී.

වත්කම්වල ඇස්තමේන්තුගත ආයුකාලය අනුව සරල මාර්ග පදනම මත පහත දැක්වෙන පරිදි ක්ෂය ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 20% |
| යන්ත්‍රෝපකරණ | 33.33% |

(ඇ) බදුකරණය

උපයනවිට ගෙවීම් බද්ද දේශීය ආදායම් පනතේ 01 වගුව මත පදනම් වේ.

## 5.3 විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/C/WBB/2022/FA/01 ඔබේ අංකය / உமது இல. / Your No } දිනය / திகதி / Date } 2023 ජූලි 06 දින.

RECEIVED
11 JUL 2023
Welfare Benefit Board

සභාපති

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනට අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංශෝධිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### .3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණිත වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### .4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම් වියදම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

**2.1.1** 2018 අංක 19 දරන විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සදහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| | නීති, රීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වුව ද, 2022 වර්ෂයට අදාල වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023 ජුනි 30 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 2 වගන්තිය | සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, සභාපතිවරයාගෙන් සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සමාජිකයින් 4 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් 2022 ජනවාරි සිට ජූලි මාසය දක්වා සභාපතිවරයෙක් සහ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා සමාජිකයන් දෙදෙනෙකු නොමැතිව කටයුතු කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණය හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2022 වර්ෂය වන විට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා වසර 06 ඉක්මවා ඇතත් එහි ප්‍රධාන කාර්යභාරය වන, සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සහ එහි ප්‍රතිඵලයක් වන

ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ කිරීමත්, තොරතුරු තාක්ෂණික ප්‍රතිපත්ති සැකසීමත් සුභ සාධන ප්‍රතිලාභ ගෙවීම සඳහා ප්‍රතිලාභියා හඳුනාගැනීම සඳහා පොදු නිර්නායක හා දර්ශක සකස් කිරීම සහ මනා නිපුණතා වලින් හෙබි වූ කාර්ය මණ්ඩලයක් බඳවාගැනීම 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර නොමැති බව.

## 2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) තිරසාර සංවර්ධන අරමුණ යටතේ සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ මූලික අරමුණ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ඒකාබද්ධ සුබසාධක කළමනාකරණ පද්ධතියක් සකස් කිරීමත්, සුබසාධක ප්‍රතිලාභ ගෙවීමට සුදුසු පුද්ගලයන්ව තෝරාගෙන ප්‍රතිලාභ ගෙවීම වුවද 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම අරමුණු ඉටු කර ගැනිමට අවශ්‍ය වැඩසටහන් හා පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2022.12.31 දිනට පැවති කාර්ය මණ්ඩල තොරතුරු අනුව අනුමත තනතුරු සංඛ්‍යාව 17 ක් වූ අතර ඉන් තනතුරු 03 ක, පුරප්පාඩු 05 ක් සහ තනතුරු 01 ක අතිරික්තයක් පැවතුනි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## 5.4 විගණන වාර්තාවට අනුව කරුණු පැහැදිලි කිරීම

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

**WELFARE BENEFITS BOARD**

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MF/WBB/ACCT./AU.Q/2023 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.06. 21 |

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

<u>සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ අංක TPD/C/WBB/2022/FA/01 හා 2023.06.20 දිනැති විගණන විමසුම හා බැඳේ.

02. ඒ අනුව, එහි සඳහන් විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් මාගේ අදහස් හා ගනු ලැබූ පියවර මෙහි ඇති ඇමුණුමෙහි පරිදි ඔබ වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.

සී.විජයරත්න
සභාපති/කොමසාරිස්

ඇමුණුම

**2.2.2. (අ),(ආ),(ඇ),(ඈ)** යටතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඉදිරි වර්ෂයන්හි ගිණුම් පිළියෙල කිරීමේ දී, නිසි අවධානය යොමු කර අදාළ ගැලපීම් සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී.

**(ඉ)** 2023 පෙබරවාරි 28 දින වන විට 2022 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති අතර මේ වන විට එය සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

**2.2.3. (අ)** ඔබගේ නිරීක්ෂණ සමග එකඟ වෙමි.

**2.3. (අ)** 2022 ජූලි මස දක්වා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා සභාපතිවරයෙක් හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් නොකිරීම හේතුවෙන් සම්පූර්ණ කාර්යය මණ්ඩලයක් මෙම මණ්ඩලයේ නොසිටි බැවින් 2022 වර්ෂය සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

**(ආ)** සමාජ ජල ආරක්ෂණ ව්‍යාපෘතියේ රාජකාරී ඉටු කළ G.I.C.පෙරේරා මහතා (කා.කා.ස.) 2022.09.27 දින සිට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත අනුයුක්ත කර ඇති අතර 2022.09.27 දින සිට 2022.09.30 දින දක්වා කාලය තුළ ඔහු විසින් ඉටු කළ අතිකාල ප්‍රමාණයට අදාළ රු. 1,701.00 ක මුදල මෙම මණ්ඩලය මගින් මුදල් අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණය කර ඇත.

අත්පසුවීමකින් ගමන් වියදම්, වැටුප් හා වේතන වියදමින් දරා ඇති අතර ඉදිරියට එය නිවැරදි කර ගැනීමට සටහන් කර ගනිමි.

**(ඇ)** මෙම වියදම් වාර්තාගත කිරීමේදී ඇති වූ ප්‍රමාදදෝෂයකින් එය ලිපිද්‍රව්‍ය යටතේ වාර්තා කර ඇති අතර ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙය නිවැරදි කිරීමට සටහන් කර ගනිමි.

**(ඈ)** නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

**(ඉ)** ජංගම දුරකථනය අත්පසුවීමකින් ස්ථාවර වත්කමක් ලෙස හඳුනා නොගැනීම මත මෙම තත්වය ඇති වී ඇති අතර ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී මෙය නිවැරදිව ගැලපීමට සටහන් කර ගන්නා ලදී.

**(ඊ)** 2022 වර්ෂයේ ආරම්භයේ සිට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සඳහා කොමසාරිස්වරයෙක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් නොසිටි අතර 2022 ජූලි මාසයේ කොමසාරිස්වරයෙක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමෙන් පසු සුබසාධක ප්‍රතිලාභ ගෙවීමට සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කරන ලදී. මෙම ක්‍රියාවලිය සඳහා අවශ්‍ය පනත් සම්මත කර ගැනීම ඉන්පසු සිදු විය. විළඟ පියවර වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මහජනතාවගෙන් අයදුම්පත් කැඳවීම සිදු වූ අතර අවස්ථා දෙකකදීම අයදුම්පත් භාර ගන්නා කාල සීමාව දීර්ඝ කරන ලදී. තවද මෙය සම්පූර්ණයෙන් පරිගණක පද්ධතියක් ඔස්සේ ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් බැවින් ඒ සඳහා නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට සිදු වීම නිසාත්, ඇතැම් රාජ්‍ය නිලධාරීන් මෙම වැඩසටහනට සහාය නොදක්වා සිටීම නිසාත් මෙම වැඩසටහන නියමිත කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. දැනට මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරමින් පවතී.

**(උ)** සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් පහත පරිදි පත් කර ඇත.

| නම | තනතුර | පත් කළ දිනය | රාජකාරි භාරගත් දිනය |
|---|---|---|---|
| බී.විජයරත්න | සභාපති/කොමසාරිස් | 2022.07.07 | 2022.07.26 |
| ඒ.දේශප්‍රිය | සාමාජික | 2022.07.07 | 2022.07.25 |
| එච්.ටී.කේ.පත්මසිරි | සාමාජික | 2022.07.07 | 2022.07.25 |
| කේ.දූනුසිංහ | සාමාජික | 2022.09.16 | 2022.09.21 |
| කේ.එච්.ජේ.මිලර් | සාමාජික | 2022.09.22 | 2022.09.23 |

**(ඌ)** එකඟ වෙමි. 2018.07.16 දින සිට නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 02 යටපත් කර අතිරේක කොමසාරිස් හා සහකාර කොමසාරිස් තනතුරු 01 බැගින් ඇති කර ඇත.

## 6 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

| ශ්‍රේණිය බාණ්ඩය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|
| | සභාපති / කොමසාරිස් | 1 | 1 |
| HM 1-1 | අතිරේක කොමසාරිස් | 1 | 1 (වැඩබලන) |
| MM 1-1 | නියෝජ්‍ය කොමසාරිස් | 1 | - |
| MM 1-1 | සහකාර කොමසාරිස් | 1 | 1 (වැඩබලන) |
| HM 1-3 | ගණකාධිකාරී | 1 | 1 (වැඩබලන) |
| MA - 3 | සංවර්ධන නිලධාරී | 1 | 1 (මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කර ඇත) |
| MA 1-2 | කළමනාකරණ සහකාර | 2 | 3 (මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කර ඇත) |
| PL-1 | කාර්යාල සහයක | 2 | 2 (මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අමාත්‍යාංශය මඟින් අනුයුක්ත කර ඇත) |
| PL-3 | රියදුරු | 2 | 1 |
| | මෘදුකාංග සංවර්ධක | 1 | 1 (කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත) |
| | පද්ධති පරිපාලක | 1 | 1 (කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත) |
| | තොරතුරු තාක්ෂණ විධායක | 2 | 1 (කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇත) |
| | හෙල්ප් ඩෙස්ක් ක්‍රියාකරු | 3 | - |

| **සංවිධාන මට්ටම** | **අනුමත සේවක ගණන** | **පවතින සේවා ගණන** |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 4 | 4 |
| ද්විතියික | 3 | 4 |
| ප්‍රාථමික | 4 | 3 |
| මෘදුකාංග සංවර්ධන | 1 | 1 |
| පද්ධති පරිපාලක | 1 | 1 |
| තොරතුරු තාක්ෂණ විධායක | 2 | 1 |
| හෙල්ප් ඩෙස්ක් ක්‍රියාකරු | 3 | 0 |
| **මුළු** | **18** | **14** |

## 7 වන පරිච්ඡේදය-කාර්යභාරය ඉටු කිරිමේදී මුහුණදුන් අභියෝග හා ගැටළු

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යභාරය ඉටුකරගෙන යාමේදී,

- ප්‍රමාණවත් සේවක පිරිසක් බඳවාගෙන නොසිටීම
- IWMS පද්ධතිය හඳුන්වාදීමේදී සහ ක්‍රියාත්ක කිරීමේදී මතුවූ තාක්ෂණික ගැටළු සහ තාක්ෂණික දැනුමැති මානව සම්පත් හිඟභාවය
- දත්ත සංගණනය ක්‍රියාත්මක කිරීමේදී දත්ත ලබා ගැනිම සඳහා අස්වැසුම සම්බන්ධයෙන් ප්‍රජාවගේ සහ සංගණන නිලධාරීන්ගේ දැනුවත්භාවය අඩුබව
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල නිලධාරීන්ට දත්ත එක්රැස් කිරීමේදී විවිධ පාර්ශව වලින් එල්ල වූ විරෝධතා පෙන්වා දිය හැකිය.